2025 සැප්තැම්බර්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

තොරතුරු මාසිකය

# විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ණය

**අප මේ වන විට පසුගිය වසරවලට සාපේක්ෂව රාජ්‍ය ණය සම්බන්ධව කිසියම් ප්‍රගතියක් 2025 වසරේ ලබගෙන ඇත. ණය ලබා ගැනීමේ අරමුණු, ණය කොන්දේසි, ලබා ගන්නා ණය උපයෝජනය කිරීම යන අංශවලින් මෙම ප්‍රගතිය අත්පත් කරගෙන ඇත. ණය බර නිසාම බංකොලොත්භාවයට පත්වුණ රටක් ඉතා කෙටි කලකින් ණය අර්බුදය කළමනාකරණය කර ගැනීමට සමත්වීම යනු, ආර්ථික වශයෙන් ඉතා වැදගත් සන්ධිස්ථානයකට පැමිණීමකි. ණය අවදානම 2022 අප්‍රේල් 14 වන විට ජාත්‍යන්තර ෆිච් රේටින්ග්ස් ආයතනයට අනුව C කාණ්ඩය දක්වා පහළ දමා තිබූ අතර, එය රටකට වෙනත් කිසිදු රටක් ණය ලබා නොදෙන මට්ටමේ වර්ගීකරණයකි.**




එහෙත්, මේ වන විට එම තත්ත්වයෙන් ඉහලට ගොස් CCC+ මට්ටම දක්වා ස්ථාවර මට්ටමකට පත්වීමත්, ණය ගැනීමේ අවදානම් තත්ත්වයෙන් ඉවත් කිරීමත් අනාගත මූල්‍ය වෙළෙඳපොළ යහපත් තත්ත්වයකට පත්වීමට ඇති සුබ නිමිතිය.

ශ්‍රී ලංකාවේ මෑතකාලීන රාජ්‍ය ණය තත්ත්වය පසුගිය 2024 ජූනි මාසයට අනුව පහත පරිදි වේ: (01 වගුව)

විදේශීය ණය සංයුතිය 2025 ජූනි මාසය වන විට පහත පරිදි වන අතර, එහි 2022දී නොගෙවූ ණය වාරික ප්‍රමාණයක්ද ඇතුළත්ව ඇත. (02 වගුව)

2020 වර්ෂයේ සිට 2024 දක්වා කාලය තුළ ආසන්න වශයෙන් ණය ප්‍රමාණය දෙගුණයකින් ඉහළ ගොස් තිබූ අතර, එම අසාමාන්‍ය ණය ගැනීමේ ගැටලුවෙන් ආර්ථිකයට කළ සෘණාත්මක බලපෑම තවත් වසර ගණනක් පවතිනු ඇත. 2024 සිට මාස 06ක කාලය සඳහා ණය ඉහළ ගොස් ඇත්තේ 7%කින් පමණ වන අතර, එය පවතින අර්බුදයට සාපේක්ෂව සාමාන්‍ය තත්ත්වයකි.

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය (රු. බිලියන) 01 වගුව**

| වර්ෂය | 2020 | 2024 | 2025 |
|---|---|---|---|
| **දේශීය ණය** | 9,065 | 18,309 | 19,655 |
| **විදේශීය ණය** | 6,052 | 10,429 | 11,140 |
| **මුළු එකතුව** | 15,117 | 28,738 | 30,795 |

**විදේශ ණය - 2025 ජූනි දක්වා - (රු.බිලියන) 02 වගුව**

| විස්තරය | ණය | නොගෙවූ වාරික |
|---|---|---|
| **බහුපාර්ශ්වික ණය** | **4,035** | **231** |
| ආසියානු සංවර්ධන බැංකුව | 2,016 | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 418 | |
| ලෝක බැංකුව | 1,424 | |
| වෙනත් ආයතන | 175 | |
| **ද්විපාර්ශ්වික ණය** | 3,300 | **81** |
| **වාණිජ ණය** | 3,805 | |
| ජාත්‍යාඃ ස්වෛරී බැඳුම්කර | 10,255 | |
| චීන සංවර්ධන බැංකුව | 2,430 | |
| **මුළු එකතුව** | **11,140** | **312** |

අනෙක් අතට මෙම විදේශීය ණය සංයුතිය සැකසී ඇත්තේ පහත පරිදිය. (03 වගුව)

ඒ අනුව ව්‍යාපෘති නොවන ණය ප්‍රමාණය පසුගිය වසරවල ඉහළ යාම තුළ අනාගතයේ ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය අඩු නිසා එය අනාගතයේ ණය ගෙවීමේදී ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කරයි. එයට හේතුව එමගින් ණය ගෙවීමට සමත් මුදලක් උත්පාදනය නොකරන නිසාවෙනි. එහෙත්, පසුගිය වසරේ අවසාන භාගයේ සිට

07 කලාපය

රජය මෙම ව්‍යාපෘති නොවන ණය ලබා නොගැනීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. අනෙක් අතට තනි ණය හිමියකු ලෙස විශාල ණය පංගුවකට හිමිකම් කියන්නේ ආසියානු සංවර්ධන බැංකුවයි. මුළු විදේශ ණය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිශතය 3.75%කි.

ණය වාරික ගෙවීම සම්බන්ධයෙන් සලකා බලන කල 2025 දෙවන කාර්තුව අවසාන වන විට ගෙවා ඇති ණය වාරික සහ පොලී ප්‍රමාණය පහත පරිදි වේ. (04 වගුව)

ඉහත සංඛ්‍යා අනුව අප තවමත් ගෙවමින් සිටින්නේ දේශීය වෙළෙඳපොළෙන් ලබා ගත් ණයවලට අදාළ පොලී සහ වාරික පමණි. මෙය ඉදිරි වර්ෂවලදී ගෙවීමට සිදුවන ණය සහ වාරික සමඟ සාකච්ඡාවට බඳුන් විය යුතු කරුණකි. අනාගතයේ ණය කළමනාකරණයට ආණ්ඩුව අනුගමනය කරන ක්‍රමවේද සහ විදේශ විනිමය උපයා ගැනීම් ප්‍රමාණය මත මෙම ණය අර්බුදය කළමනාකරණය කරගත හැකිවන බවට විශ්වාසයක් ඇත. එහෙත්, රාජ්‍ය වියදම් අවම කර ගැනීම, නාස්තිය සහ දූෂණය මුලිනුපුටා දැමීම වැනි කරුණු අත්‍යවශ්‍ය සාධක බවට පත්වේ. රාජ්‍ය වියදම් කළමනාකරණය මඟින් දේශීය ණය ගැනීමේ අවශ්‍යතාව අවම කරගත හැකි වන අතර, ඒ තුළින් රාජ්‍ය ණය සඳහා ඇති කරනු ලබන පීඩනය අවම කරගත හැකිය. අනෙක් අතට විදේශීය ණය වාරික ගෙවීම සඳහා ඩොලර් සංචිත ඉහළ නංවාගත යුතු අතර, ඒ සඳහා නව උපායමාර්ග අනුගමනය කිරීමට සිදුවනු ඇත.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසුව ලංකාවට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවලට ගෙවීමට සිදුවන්නේ 2026 වසරේ සිටයි. ඒ අනුව ස්වෛරී බැඳුම්කර සඳහා 2026 සහ 2027 වසරවල ඩොලර් මිලියන 330 බැගින්ද, 2028 වසරේ ඩොලර් මිලියන 544ක් ද ලෙස ණය ගෙවීම ආරම්භ කළ යුතුව ඇත. 2028 අප්‍රේල් 15 වැනි දින වන විට ස්වෛරී බැඳුම්කර සඳහා පමණක් ඩොලර් මිලියන 1,204ක් ගෙවිය යුතු අතර, මෙය අනිවාර්ය ගෙවීමක් ලෙස පවතී. එහෙත්, වර්තමානයේ වර්ධනය වන විදේශ විනිමය ඉපැයීම් සහ ආර්ථික වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යා හැකි වුවහොත්, මෙය එතරම් අසීරු කටයුත්තක් නොවනු ඇත.

**විදේශීය ණය සංයුතිය (රු. බිලියන) - 03 වගුව**

| විස්තරය | 2020 | 2022 | 2024 |
|---|---|---|---|
| **ව්‍යාපෘති ණය** | 4,035 | 7,347 | 6,218 |
| **ව්‍යාපෘති නොවන ණය** | 2,594 | 5,110 | 4,210 |

**ණය වාරික සහ පොලී ගෙවීම ( රු. බිලියන) - 04 වගුව**

| වර්ෂය | ණය වාරික | පොලිය | එකතුව |
|---|---|---|---|
| **දේශීය ණය** | **9,770** | **1,671** | **8,441** |
| භාණ්ඩාගාර බිල්පත් | 5,880 | 330 | 3,210 |
| භාණ්ඩාගර බැඳුම්කර | 890 | 1,341 | 2,231 |
| **විදේශීය ණය** | **715** | **237** | **952** |
| ද්විපාර්ශවික ණය | 200 | 15 | 215 |
| බහුපාර්ශවික ණය | 166 | 113 | 279 |
| වෙළෙඳපොළ ණය | 349 | 109 | 458 |
| **මුළු එකතුව** | | | **9,393** |

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ලබා ගන්නා ණය ප්‍රමාණය ඩොලර් මිලියන 3,000ක් වන අතර, එය එක් වාරිකයකට ඩොලර් මිලියන 333ක් ලෙස වාරික 09කින් ලැබීමට නියමිතය. මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගිවිසුම සහ වාරික ලබා ගැනීම ආරම්භ වන්නේ අප ආණ්ඩුව ලබා ගැනීමටත් පෙර සිටය. එය පහත වගුව මඟින් දැක්විය හැකිය. (05 වගුව)

**ජා. මු . අරමුදලේ ණය ගිවිසුම සහ වාරික ලබා ගැනීම - 05 වගුව**

| වාරිකය | වාරික විමසුමට ගන්නා දිනය (Staff level Agreement) | වාරිකය ලද දිනය |
|---|---|---|
| **මුල් අත්තිකාරම** | **01.09.2022** | **22.03.2023** |
| **01 විමසුම (Review)** | **19.10.2023** | **14.12.2023** |
| **02 විමසුම** | **21.04.2024** | **14.06.2024** |
| **03 විමසුම** | **23.11.2024** | **04.03.2025** |
| **04 විමසුම** | **25.04.2025** | **03.07.2025** |
| **05 විමසුම** | **2025 දෙසැම්බර්** | |

මෙලෙස 2027 ජුනි මාසයේ 08 වැනි අවසාන විමසුමෙන් පසු වාරික 09 සම්පූර්ණ වේ. මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ගිවිසුම සහ මුල් වාරික 03ම අප ආණ්ඩු බලය ලබා ගැනීමටත් පෙරම ලබාගෙන තිබූ අතර, එය ඉදිරියට පවත්වාගෙන යාම හැර වෙනත් විකල්පයක් නව රජය සතු නොවීය. ජාත්‍යන්තර ආයතන සමඟ ගනුදෙනු කිරීමේදී දේශපාලන කෝණයට එහා ගොස් ගනුදෙනු කිරීමට සිදුවන්නේ මෙවැනි අවස්ථාවලය.

අනෙක් අතට මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය භාවිත කළ හැකි කොන්දේසි පවතින අතර, ඒවා පැවැති අර්බුදයට සාපේක්ෂව බොහෝ සාධනීය කරුණු වේ. මෙම ණය වාරික මූලික ලෙසම රාජ්‍යයේ පිස්කල් ප්‍රතිපත්ති හැසිරවීම, සමාජ ආරක්ෂණ ක්‍රමවේද නිර්මාණය, ණය තිරසරභාවය පවත්වා ගැනීම, ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම, වංචා සහ දූෂණ නතර කිරීම වැනි කරුණු ගණනාවක් සමඟ බැඳී පවතී. එලෙසම අනෙකුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමට පහසුකම් සහ විශ්වාසය ඇතිකිරීම සඳහාද, ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම්වල ඉහළට ඒම සඳහාද මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කරන ගනුදෙනුව බංකොළොත්භාවයේ පතුලේ සිටින රටකට අතිශය වැදගත් වේ.

# 'ප්‍රජාශක්ති' හඳුනා ගනිමු

"ප්‍රාතික ජන බලවේගයේ සමාජ ආරක්ෂණ සහ සුභසාධන වැඩපිළිවෙළේ අරමුණ වන්නේ සමාජ සුබසාධන ප්‍රතිලාභ ලැබිය යුතු පිරිස්වල ජීවන තත්ත්වය උසස් කිරීමත්, ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගන්වා හැකි ඉක්මනින් දිළිඳු බවින් මුදා ආර්ථිකයේ සක්‍රිය කොටස්කරුවන් බවට පත්කිරීමයි."

ඉහත උපුටනය ජාතික ජන බලවේගය විසින් ජනාධිපතිවරණය වෙනුවෙන් ජනතාව අතට පත් කරන ලද 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 54වැනි පිටුවෙනි.


ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු මේ සංකල්පය හුදු මැතිවරණ ලියැවිල්ලකින් ඔබ්බට ගොස් ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදෙන අවස්ථාවට එළැඹ තිබේ. ඒ ජාතික ජනබලවේග ආණ්ඩුව ප්‍රජාශක්ති - සවිබල ගැන්වීමේ ජාතික ව්‍යාපාරය දියත් කිරීමත් සමඟ ය. මෙතෙක් පැවැති පාලනයන්ට ජනතාව සැබෑ ලෙසම නඟාසිටුවීමේ වුවමනාවක් නොවූ නිසාම ක්‍රියාත්මක වූයේ හුදු දිළිඳු ජනතාවට සහනාධාර ලබා දීම ප්‍රමුඛ කර ගත් සමාජ ආරක්ෂණ වැඩසටහනකි. එම වැඩසටහන් මහජන අවශ්‍යතා නියෝජනය නොවීම, මහජන සහභාගිත්වය අවම වීම, ජාතික ප්‍රතිපත්තියක් වෙනුවට දේශපාලන අවශ්‍යතා මත ක්‍රියාත්මක වීම වැනි විවිධ ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් අසාර්ථක වී තිබේ.

කෙසේ නමුත්, ප්‍රජාශක්ති අභ්‍යන්තරිකවම හා ඉලක්කසහගතව ග්‍රාමීය හා නාගරික දිළිඳුකම පිටුදැකීම හා ප්‍රජාව සවිබල ගැන්වීම වෙනුවෙන්වූ උපායමාර්ගික ප්‍රවේශයක් අන්තර්ගත කර ගත් ජාතික ව්‍යාපාරයකි.

## දරිද්‍රතාවයේ පැතිකඩ

කුටුම්භ ආදායම් හා වියදම් සම්බන්ධ 2019 සංගණනයේදී ලැබී ඇති දත්ත පහත පරිදි ය:

පොදුවේ රටේ ජනගහනයෙන් 78.3%ක් නාගරිකව ජීවත් වන අතර, ග්‍රාමීයව 17.2%ක්ද, වතු ආශ්‍රිතව 4.5%ක්ද ජීවත් වෙති. එසේම බහුමානික දරිද්‍රතාවෙන් පෙළෙන (සෞඛ්‍යය, අධ්‍යාපනය හා ජීවන තත්ත්වයට අදාළ කොන්දේසි සම්පූර්ණ කරගත නොහැකි) ජනගහනයෙන් සියයට 80.9ක ප්‍රතිශතයක් ග්‍රාමීයව ද, සියයට 14.4ක් වතු ආශ්‍රිතව ද, සියයට 4.7ක් නාගරිකව ද ජීවත් වෙති. මෙහි අදහස මුළු ජනගහනයෙන් 16%ක් එනම් සෑම පුද්ගලයන් 06 දෙනෙකුගෙන්ම එක් අයකු බහුමාන දරිද්‍රතාවෙන් පෙළෙන බව ය. එසේම ග්‍රාමීය හා වතු ආශ්‍රිත ජනතාව අතර බහුමානික දරිද්‍රතාව 95.3%ක් තරම් ඉහළ අගයක් ගන්නා බව ය.




Source: Household Income and Expenditure Survey, 2019

## උපායමාර්ගික ප්‍රවේශය

ප්‍රජාශක්ති මූලික වශයෙන් ආකාර 02කින් ක්‍රියාත්මක වේ. 01. ජීවන ක්‍රමය වෙනස් කිරීම - මේ යටතේ දිළිඳු පුද්ගලයකුට පරිපූර්ණ වූ ද, ගෞරවනීය වූ ද, නවීන වූද, අභිමානවත් වූ ද කුටුම්භ සහ සමාජ ජීවිතයකට හිමිකම් කිව හැකි තත්ත්වයක් ගොඩනැඟීමට අපේක්ෂිත ය.




02. පරිසරය වෙනස් කිරීම - මේ අනුව ආර්ථික වශයෙන් ධනවත් හා ශක්තිමත් වන්නාවූ ද රටක් ගොඩනැඟීම මඟින් පුරවැසි ජීවිත සමාජීය වශයෙන් සුවපහසු හා ආරක්ෂිත වන්නාවූ ද පරිසරයක් ගොඩනැඟීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රජාශක්ති,**

- සමාජ සහයෝගීතාව.
- සමාජ සවිබලගැන්වීම.
- ජීවන චක්‍රය පදනම් කරගත් සමාජ ආරක්ෂාව.
- සමාජ සාධාරණත්වය සහ කිසිවකු අත්නොහැරීම.

යන මූලධර්ම 04ක් මත ක්‍රියාත්මක වන අතර ජාතික මට්ටමේ නායකත්වයක් ලබාදීම, මහජන කේන්ද්‍රීය ව්‍යුහයක් සැකසීම සහ ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනී.

සවිබල ගැන්වීම සහ රැකවරණය යන සංවර්ධන ප්‍රවේශ ද්විත්වය ඔස්සේ ප්‍රජාශක්ති ක්‍රියාත්මක වනු ඇත. සවිබල ගැන්වීම යටතේ

- ග්‍රාමීය ආර්ථික ප්‍රසාරණය, ආර්ථික කටයුතුවල සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමත්
- පෞද්ගලික, මහජන, රාජ්‍ය හවුල්කාරීත්වය (PPPP) මඟින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් බිහි කිරීමත්
- දැනුම, කුසලතා, ආකල්පමය වශයෙන් ජනතාව සංවර්ධනය කිරීමත් අරමුණු කරගෙන ඇත.

රැකවරණය යටතේ ජීවන චක්‍ර ප්‍රවේශය (Life Cycle Approach) පාදක කොට ගත් සමාජ ආරක්ෂණ/සුරක්ෂිතතා වැඩසටහන් මඟින් අවදානම් කාණ්ඩවල විශ්වීය සමාජ

# මානව පරිණාමය පිළිබඳ නූ

**පසුගිය කලාපය හා සම්බන්ධයි**

## හෝමෝ ලුසෝනෙන්සිස් (*Homo Luzonensis*)

පිලිපීනයේ ලුසොන් දූපතෙන් පමණක් හමුවී ඇති වෙනත් ආදි මානව විශේෂයක් ලෙස හෝමෝ ලුසෝනෙන්සිස් හැඳින්විය හැකිය. ඔවුන්ගේ පොසිල ලුසොන් දූපතෙන් හමුවූ නිසා මෙම විශේෂය ලුසෝනෙන්සිස් ලෙස නම් කර ඇත. එම දූපත මානව විශේෂ විසින් ජනාවාසකරණය කරන්නට පටන් ගන්නට ඇත්තේ, අදින් වසර 7,70,000 - 6,30,000කට පමණ පෙර බව විද්‍යාඥයන්ගේ අදහසයි.

එලෙස ලුසොන් දූපතට සංක්‍රමණය වූ ආසියානු හෝමෝ ඉරෙක්ටස් මානවයා හරහා මෙම විශේෂය බොහෝ විට පරිණාමය වන්නට ඇති බවට අදහස් පළව ඇත. එහෙත්, සමහරකු විසින් අදහස් පළ කරනු ලබන්නේ මෙතෙක් අප හඳුනා නොගත් මානව විශේෂයක් හරහා ඔවුන් පරිණාමය වන්නට ඇති බවයි. දැනට ලැබී ඇති සීමිත සාක්ෂි අනුව මෙම මානව විශේෂය අදින් වසර 1,34,000කට පමණ පෙර බිහිවන්නට ඇති බවත්, අදින් වසර 14,000කට පමණ පෙර මිහිමතින් වඳව යන්නට ඇති බවත් විශ්වාස කෙරේ.


මෙම මානව විශේෂයට අයත් අස්ථි කොටස් ලුසොන් දූපතේ කල්ලාඕ ගුහාවෙන් ප්‍රථමවරට සොයා ගනු ලැබුවේ 2007දී ආමාන්ඩ් මිජාරෙස් නම් පිලිපීන ජාතික පුරාවිද්‍යාඥවරිය විසිනි. එහෙත්, මේවා ආදි හෝමෝ සේපියන් මානව අස්ථි කොටස් බව මුලදී විශ්වාස කරනු ලැබුවද, ඒවා සතුව ඔස්ත්‍රෙලෝපිතකස් ලක්ෂණද පවතින බව පසුකාලීනව සොයාගන්නා ලදී. එම නිසා මෙම අස්ථි කොටස් නව මානව විශේෂයකට අයත් ලෙස 2019 වසරේදී නම් කරන ලදී.

හෝමෝ ලුසෝනෙන්සිස් යනු ශරීර ප්‍රමාණයෙන් කුඩා, කුරු මානව විශේෂයකි. පොසිල සාක්ෂි සීමිතවීම නිසා මෙතෙක් නිවැරැදිවම කිව නොහැකි වුවත්, මෙම මානව විශේෂයට අයත් වැඩුණු පිරිමි අයකුගේ උස අඩි 4යි අඟල් 11ක් පමණද, ගැහැනු අයකුගේ උස අඩි 4යි අඟල් 8ක් පමණද වන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඔවුනට කුඩා චාර්වක දත් තිබී ඇති අතර, දත් පේළියේ පිටුපසට යන විට දත් ක්‍රමානුකූලව කුඩාවී ඇත. ඔවුන්ගේ අනෙකුත් දත්වලට සාපේක්ෂව සැලකූවිට පුරස්චාර්වක දත් අසාමාන්‍ය ලෙස විශාල ලෙස පිහිටා ඇත්තේ පැරැන්ත්‍රොපස් විශේෂයන්ට සමාන ආකාරයටය. එමෙන්ම ඔස්ත්‍රෙලෝපිතකස්, හෝමෝ ෆ්ලොරේසියන්සිස් සහ සමහර හෝමෝ සේපියන් මානවයන්ගේ මෙන් දිගු ඇඟිලි ඔවුන් සතුවිය. ඇඟිලි සහ අත්ලේ පේශි පිහිටීම ඔස්ත්‍රෙලෝපිතකස්ගේ සහ හෝමෝ හැබිලිස්ගේ මෙන් විය. එහෙත්, දෙපයින් ඇවිදීම පහසු වන ලෙස නූතන හෝමෝ විශේෂයන්ගේ මෙන් පාද සැකසී ඇත.

කල්ලාඕ ගුහාව ආශ්‍රිතව කැපුම් සලකුණු සහිත මුව අස්ථි හමුවීමෙන් පෙනී යන්නේ මෙම මානව විශේෂය ආයුධ භාවිත කර ඇති බවයි. එහෙත්, එසේ සොයාගෙන ඇති ගල් ආයුධ ප්‍රමාණය ඉතාමත් සුළු ප්‍රමාණයකි. එම නිසා එළැඹිය හැකි නිගමනය වන්නේ ඔවුන් සිය ආයුධ නිපදවාගෙන ඇත්තේ ලී දඬු හෝ සත්ව අස්ථි ආදියෙන් බවයි. එසේත් නැතිනම් ඔවුන් මස් සැකසීම ගුහාවෙන් පරිබාහිරව හෝ දඩයම සිදුකළ ස්ථානයේදීම සිදු කරන්නට ඇත. ලුසෝන් දූපතේම රිසාල්, කාලින්ග ප්‍රදේශ ආශ්‍රිතව අදින් වසර 7,10,000කට පමණ පෙර මරා දමා මස් කරන ලද රයිනෝසිරස් අස්ථිද හමුව ඇත. ඒවා මෙම දූපතේ මුල් පදිංචිකරුවන් සිදුකරන ලද්දක් විය හැකිය.




**හෝමෝ ලුසෝනෙන්සිස් මානවයාගේ උපකල්පිත රුවක්**



**පිලිපීනයේ ලුසොන් දූපතේ කල්ලාඕ ගුහාව**



**හෝමෝ ලුසෝනෙන්සිස් මානවයෙකුට අයත් දත්**




**ඔස්ත්‍රලෝපිතකස් මානවයා සහ හෝමෝ සේපියන් සාපේක්ෂව හෝමෝ ලුසෝනෙන්සිස් මානවයින්ගේ**

# ූතන ගවේෂණ 15 - කොටස

හෝමෝ ලූසොනෙන්සිස් හා සමකාලීනව හෝමෝ ෆ්ලොරේසියන්සිස්, හෝමෝ සේපියන්, හෝමෝ ඉරෙක්ටස්, නියැන්ඩර්තාල්, ඩැනිසෝවන් යන මානව විශේෂද මිහිමත වාසය කර ඇත. එක් පසෙකින් හෝමෝ සේපියන් පරිණාමය වෙමින් ඉදිරියට පැමිණෙද්දී, තවත් මාර්ගයක් ඔස්සේ පරිණාමය වී අතුරුදන්ව ගිය මානව විශේෂයක් ලෙස මෙම මානව විශේෂය හඳුනාගත හැකිය.



හෝමෝ ෆ්ලොරේසියන්සිස් හිස් කබලක් ඇසුරින් නිර්මිතරුවක්




හෝමෝ ෆ්ලොරේසියන්සිස් මානවයාගේ හිස් කබලක්

## හෝමෝ ෆ්ලොරේසියන්සිස් (Homo Floresiensis)

නූතන මානවයන් අග්නිදිග ආසියානු කලාපය හරහා ඕස්ට්‍රේලියාවට ඇතුළුවීම පිළිබඳව පර්යේෂණ සිදු කළ ඕස්ට්‍රේලියා-ඉන්දුනීසියා විද්‍යාඥයන් කණ්ඩායමක් විසින් 2003 වසරේදී මෙම මානව විශේෂයට අයත් පොසිල සොයා ගන්නා ලදී. ඒවා සොයා ගන්නා ලද්දේ ඉන්දුනීසියාවේ ෆ්ලෝර් නම් දූපතෙන්වූ බැවින්, මෙම නව මානව විශේෂයට හෝමෝ ෆ්ලොරේසියන්සිස් යන නාමය තබා තිබේ. 'ෆ්ලෝර් මිනිසා', 'හොබිට්' යන් අන්වර්ථ නාමයන්ගෙන් හඳුන්වනු ලබන්නේද මෙම මානවයායි. ඉන්දුනීසියාවේ ලියැන්ග් බූආ ගුහාව ආශ්‍රිතව මෙම මානවයාගේ සලකුණු හමුව ඇත.

අදින් වසර 1,00,000කට පමණ පෙර මෙම මානවයා මිහිමත වාසය කළ බවට වන පැරණිතම සාක්ෂි ලැබී තිබුණද, විද්‍යාඥයන් පවසන්නේ අදින් වසර 1,90,000කට පමණ පෙර පටන්ම මෙම මානවයන් පැවතගෙන එන්නට ඇතැයි කියාය. එමෙන්ම අදින් වසර 50,000කට පමණ පෙර මෑත ඉතිහාසය දක්වා ඔවුන් පැවත එන්නට ඇතැයි ඔවුහු විශ්වාස කරති. දැනට පිළිගත් මත අනුව හෝමෝ සේපියන් මෙම කලාපයට පැමිණ ඇත්තේ, අදින් වසර 50,000කට පමණ පෙර වන අතර, මෙම මානව විශේෂය වඳවී ගොස් ඇත්තේද එම කාලයේදීමය.





...න්ස් මානවයාට ... දත් හා පාද අස්ථි

හෝමෝ ෆ්ලොරේසියන්සිස් යනු මානව විශේෂයක් වුවද, ඔවුන් කිසි ලෙසකින් හෝ අපගේ මුතුන්මිත්තන් නොවේ. නූතන මානවයාගේ පරිණාමයේදී යම් තැනකදී වෙන්ව ගොස් වෙනස් ආකාරයක පරිණාමයට ලක්ව වඳව ගිය විශේෂයක් ලෙස මෙම විශේෂය හඳුනාගත හැකිය. එමගින් මානව පරිණාම වෘක්ෂයට තවත් ශාඛාවක් එක්කර ඇත.

හෝමෝ ෆ්ලොරේසියන්සිස් පරිණාමය වූයේ ජාවා මිනිසා වැනි කලාපයේ ජීවත් වූ ආසියානු හෝමෝ ඉරෙක්ටස්ගෙන්ය යන්න මුල්කාලීනව සමහර විද්‍යාඥයෝ විශ්වාස කළහ. එහෙත්, පසුව සංවාදයට බඳුන්වූ කරුණ වූයේ මෙම මානවයන්ගේ ශරීර ලක්ෂණ අතර විශාල ප්‍රමාණයක් හෝමෝ ඉරෙක්ටස්ට වඩා පැරණි මානවයන්ගේ ආකාර ගන්නා බවයි. එසේ නම් ඔවුන් හෝමෝ හැබිලිස් හෝ හෝමෝ ජෝජිකස් වැන්නකුගෙන් පැවත එන්නකු විය යුතුය. එම නිසා දැනට පොදුවේ පිළිගන්නා පරිදි අප්‍රිකානු මහාද්වීපය තරණය කළ ප්‍රථම මානවයා හෝමෝ ඉරෙක්ටස් නොවන බවට වන තවත් තර්කයක් ලෙසද හෝමෝ ෆ්ලොරේසියන්සිස් පවතී. සමහර විද්‍යාඥයන් පවසන්නේ හෝමෝ ෆ්ලොරේසියන්සිස් සහ ආසියානු හෝමෝ ඉරෙක්ටස් යන දෙවර්ගයම එකම පූර්වජයෙක් හරහා පැතිර යන්නට ඇති බවයි.

මෙම මානව විශේෂය හමුවූ ෆ්ලෝර් දිවයින යනු වර්ග කිලෝමීටර් 13,500ක පමණ කුඩා දිවයිනක් වන අතර, ඝන කැලෑ සහ කඳුවලින් පිරි භූමියකි. එහි උසම ස්ථානය අඩි 7,300 ඉක්මවා ඇත. මෙවන් කුඩා භූමියක තනිවූ කුඩා පූර්ව මානව විශේෂයක් හුදකලාව පරිණාමය වීමෙන් මෙවන් නව මානව විශේෂයක් බිහිවන්නට ඇතැයි විශ්වාස කෙරේ. එහෙත්, අතීතයේ මුහුදු මට්ටම අවමවූ කාලයේ පවා අවම වශයෙන් කිලෝ මීටර් 24ක් පමණ මුහුද තරණය කිරීමකින් තොරව මෙම දිවයිනට පැමිණිය නොහැකිය. එවන් තත්ත්වයකදී



හෝමෝ ෆ්ලොරේසියන්සිස් මානවයෙකුට අයත් ඇටසැකිල්ලක්

මෙම මානවයන්ගේ මුතුන්මිත්තන් කෙසේ මෙම දිවයිනට පැමිණියේද යන්න අදටත් අබිරහසකි.

මෙම මානවයාට හොබිට් යන අන්වර්ථ නාමය ලැබී ඇත්තේ 'ලෝඩ් ඔෆ් ද රිංග්ස්' කතාන්දරයේ චරිතයක ආකාරයට කුඩා සිරුරක් සහ පුළුල් පාද පිහිටීම නිසාවෙනි. අන්වර්ථ නාමයේ ආකාරයටම මෙම විශේෂයේ මානවයන් උසින් ආසන්න වශයෙන් මීටරයක් (අඩි 3 අඟල් 6ක්) පමණ විය. සාමාන්‍යයෙන් පිග්මිවරුන් පවා මීටර් 1.5ක පමණ උසකින් යුක්ත වන පසුබිමක් තුළ මෙය ඉතා කුඩා අගයකි. හුදකලාවූ කුඩා කණ්ඩායමක්, කුඩා භූමි ප්‍රදේශයක දීර්ඝ කාලයක් පැවැත එද්දී, අනෙකුත්

සමහර විශාල ක්ෂීරපායීන්ට සිදුවූවාක් මෙන් පරිණාමයේදී ක්‍රමානුකූලව ශරීරය කුඩාවීම මොවුන්ටද සිදුවන්නට ඇතැයි සමහර විද්‍යාඥයෝ මත පළ කරති.

හෝමෝ ෆ්ලොරේසියන්සිස්ගේ කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර් 380ක පමණ අගයක් ගැනීමෙන් පෙනී යන්නේ ඔවුන් සතු වූයේ ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂයන්ටත් වඩා සාපේක්ෂව කුඩා මොළයක් බවයි. ඔවුන්ගේ හිස්කබලේ හැඩය බොහෝ දුරට හෝමෝ ඉරෙක්ටස්ට සමානවූ අතර, කුඩා නළලකින්ද යුක්ත විය. මෙම මානවයන්ගේ මුහුණ පැතැලි ස්වරූපයක් ගත් අතර, සිහින් නාසයකින් යුක්ත විය. එම කලාපයේම ජීවත්වූ ආසියානු හෝමෝ ඉරෙක්ටස්ගේ ඇහි බැම අස්ථි නෙරුම් ලෙස එකිනෙක සම්බන්ධවී තිබුණද, මෙම මානවයන්ගේ එය එසේ නොවීය. දත්වල පිහිටීම අනෙකුත් හෝමෝ විශේෂ හා සමාන වුවද, ඉදිරිපස දත් සාපේක්ෂව කුඩා විය.

මෙම විශේෂයට අයත් මානවයන්ගේ උරහිස්, බාහු මෙන්ම ගාත්‍රා සන්ධි නූතන මානවයාට වඩා පූර්ව හෝමෝ විශේෂයන්ට සමාන විය. හැකිළුණු උරහිස් සහ පළල් උකුල හේතුවෙන් මෙම මානවයන්ගේ සිරුර හෝමෝ සේපියන්ට වඩා වෙනස් විය. දෙපයින් ඇවිද යාමට පහසු ලෙස පාද සැකැසී තිබී ඇති අතර, විලුඹේ සිට පා ඇඟිලි දක්වා දිග සාපේක්ෂව වැඩි වීමෙන් තරමක් විශාල පාදයක් ඔවුන්ට හිමිවිය. එහෙත්, පාදය පැතැලි වීම නිසා නූතන මානවයන්ට මෙන් ඔවුනට දිවීම පහසු නොවීය. හෝමෝ හැබිලිස්, ඔස්ත්‍රෙලෝපිතකස් ආදී විශේෂයන්ටද මෙම ලක්ෂණය තිබිණි.

අතෙහි මැණික් කටුවද නූතන මානවයාගේ මෙන් පහසුවෙන් හැසිරවිය හැකි ආකාරයක් ගනු වෙනුවට පූර්ව මානව විශේෂවල ලක්ෂණ පෙන්නුම් කරන්නක් විය. අදින් වසර ලක්ෂ 8කට පමණ පෙරදී පරිණාමය විසින් මානවයාට උරුම කරදී තිබුණු වඩා දියුණු මැණික් කටුවේ ආකෘතිය මෑත ජීවත්වූ ඔවුනට ලැබී නොතිබිණි. හෝමෝ ෆ්ලොරේසියන්සිස් කාන්තාවන්ගේ ශ්‍රෝණි කුහරය නූතන මානවයාට සාපේක්ෂව විශාල විය. එය ද පූර්ව මානව විශේෂයන්ට සමානවූ ඔවුන්ගේ තවත් ශරීර ලක්ෂණයකි.

ලියැංග් බුආ ගුහාව ආශ්‍රිතව ගින්දර භාවිත කළ බවට සාක්ෂි තිබීමෙන් පෙනී යන්නේ මෙම මානවයන් ගින්දර හැසිරවීම පිළිබඳව දැනුම්වත්ව සිටි බවයි. එමෙන්ම මස් පුළුස්සා අනුභව කරනන්නට ඇති බවට සැක කළ හැකි අයුරින් පිළිස්සී ගිය සත්ව ඇටකටුද මෙම ගුහාව ආශ්‍රිතව හමුවී තිබේ.

එසේම ගල් පතුරු ආදිය මඟින් නිර්මිත විවිධ ආකාරයේ ආයුධ වර්ගද මෙම ගුහාව ආශ්‍රිතව හමුවී ඇත. එසේම සතුන් දඩයම් කිරීම වැනි කටයුතු වෙනුවෙන් භාවිත කරන්නට ඇතැයි සිතිය හැකි සියුම් ලෙස උල් කරන ලද ආයුධද සොයා ගැනීමට විද්‍යාඥයෝ සමත්ව ඇත. එම ප්‍රදේශය ආශ්‍රිතව කලකට පෙර වඳව ගිය කුරු අලි විශේෂයක් ජීවත්වී ඇති අතර, හෝමෝ ෆ්ලොරේසියන්සිස් මානවයන් මෙම අලින් දඩයම් කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. එසේම කොමොඩෝ මකරුන් වැනි මෙම කලාපයේ සිටි විශාල උරගයන් ද ඔවුන් දඩයම් කරන්නට ඇත.



පිලිපීනයේ ලුසොන් දූපත



හෝමෝ ෆ්ලොරේසියන්සිස් කොමොඩෝ මකරුන් ( komodo-dragon) දඩයම් කිරීම දැක්වෙන චිත්‍රයක්



ඉන්දුනීසියාවේ ෆ්ලෝර් දූපතේ ලියැන්ග් බුආ ගුහාව

සමහර විද්‍යාඥයන් පවසන්නේ මෙම මානවයන් එම ආයුධ භාවිත කළද, ඒවා නිපදවන්නට ඇත්තේ හෝමෝ සේපියන් බවයි. මන්ද යත්, එතරම් කුඩා මොළයකින් යුත් මානව විශේෂයකට එතරම් දියුණු ආයුධ නිපැදවිය හැකි යැයි විශ්වාස කළ නොහැකි බැවිනි. එහෙත්, එම කාලය වන විට හෝමෝ සේපියන් මානවයන් මෙම කලාපය ජනාවාසකරණය කරගෙන තිබූ බවට කිසිදු සාක්ෂියක් නොමැති වීමෙන් එම අදහස බැහැරවී ඇත. එමෙන්ම බුද්ධිමත්භාවය සඳහා මොළයේ විශාලත්වය එකම සාධකය නොවන බවට වන අදහස්ද මේ හරහා තහවුරු වී ඇත.

එසේම මෙම මානවයන් තමන්ගේ ආයුධ ලී දඬු සහ වැල් වර්ග කැපීමට භාවිත කර ඇති බවටද සාක්ෂි ඇත. ඒ අනුව ඔවුන් හෙලි වැනි ආයුධ නිපදවීම මෙන්ම දඩයම් කිරීම සඳහා උගුල් ඇටවීමද සිදුකර ඇති බවට විද්‍යාඥයෝ සැක පහළ කරති. එසේම ලියැංග් බුආ ගුහාවට කිලෝ මීටර් 50ක පමණ දුරින් මටා මෙන්ගේ නම් ප්‍රදේශය ආශ්‍රිතව මීට සමානම ගල් ආයුධ ආදිය සොයාගෙන ඇත. ඒවා වසර ලක්ෂ 7ක් පමණ පැරැණි ඒවා වන අතර හෝමෝ ෆ්ලොරේසියන්සිස් මානවයන්ගේ මුතුන්මිත්තන් විසින් ඒවා භාවිත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

කෙසේ නමුත්, මෙම මානවයන් ආභරණ හෝ වර්ණක භාවිත කළ බවට කිසිදු සාක්ෂියක් මෙතෙක් ලැබී නොමැත. එමෙන්ම මළවුන් භූමදානය කිරීම වැනි දියුණු සංස්කෘතික කටයුතු අරමුණු සහිතව සිදුකළ බවටද සාක්ෂි නොමැත.

හෝමෝ ෆ්ලොරේසියන්සිස් මානවයා ෆ්ලෝර් දිවයිනේ හුදකලාව වාසය කළ සමයේ ලෝකයේ වෙනත් ප්‍රදේශවල හෝමෝ ඉරෙක්ටස්, ඩැනිසෝවන්, නියැන්ඩර්තාල්, හෝමෝ ලුසෝනෙන්සිස්, හෝමෝ සේපියන් යන මානව විශේෂ වාසය කර ඇත. අවසානයේ අදින් වසර 55,000-35,000 අතර කාලයේදී හෝමෝ සේපියන් මෙම දිවයිනට ළඟා වන්නට ඇතැයි විශ්වාස කෙරේ. එහෙත්, ඔවුන් එකිනෙකා හමුවූවාද, එකිනෙකා අතර අන්තර් ක්‍රියා සිදුවූවාද යන්න පිළිබඳ නිවැරැදි නිගමනයකට ඒමට මෙතෙක් ප්‍රමාණවත් සාක්ෂි නොමැත. කෙසේ නමුත්, කැලෑ ප්‍රදේශ ආශ්‍රිතව කුඩා කුරු මිනිසුන් වාසය කරන බවට මතයක් අදටත් මෙම ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන ඉන්දුනීසියානු ජනතාව අතර ජනප්‍රවාදයක් ලෙස පවතී.

මීළඟ කලාපය හා සම්බන්ධයි...

## ප්‍රජා ශක්ති.... 03 - පිටුවෙන්

ආරක්ෂණය (Universal Social Protection) තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ.

### ප්‍රජාශක්ති සංවිධාන ව්‍යුහය

ග්‍රාම නිලධාරි වසමකට අදාළ බිම් මට්ටමේ ප්‍රජා සංවර්ධන සභාවක සිට ජාතික මට්ටමේ ජාතික ප්‍රතිපත්ති සභාව දක්වා මට්ටම් 06කින් යුතුව ක්‍රියාත්මක වන ව්‍යුහයක් ඇත. බිම් මට්ටමින් ලබා ගන්නා දත්ත සංවිධිත තොරතුරුවලට ගොනු කරමින් යෝජනා ලෙස ඉහළ මට්ටම්වලට යොමු කෙරෙන අතර, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවලියේ උපදෙස්වලට හරවමින් බිම් මට්ටමට මඟපෙන්වීම් ලබා දෙනු ඇත.

01. ප්‍රජා සංවර්ධන සභාව (CDC) - ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පවතින සම්පත්, සංවර්ධන අවශ්‍යතා අධ්‍යයනය කිරීම, සාකච්ඡා කිරීම, යෝජනා හඳුනා ගැනීම සහ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙළ සකස් කිරීම මෙයට පැවරෙන අතර, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ නිල බලයෙන් පත්වන ලේකම් සහ කැඳවුම්කරු ඇතුළු සාමාජිකයන් සහ සෙසු සාමාජිකයන් ලෙස මූලික වශයෙන් කොටස් 04කට අයත් පිරිස්වලින් ප්‍රජා සංවර්ධන සභාව සමන්විත වේ.

02. ප්‍රාදේශීය සංවර්ධන කමිටුව (DCC) - මේ වන විට ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සංයුතියම මේ වෙනුවෙන් යොදා ගැනේ.

03. දිස්ත්‍රික් සංවර්ධන කමිටුව (DCC) - මේ වන විට ක්‍රියාත්මක වන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සංයුතියම මේ වෙනුවෙන් යොදා ගැනේ.

04. අමාත්‍යාංශ - ප්‍රජාශක්ති විසින් අමාත්‍යාංශ 20ක් වෙන් කොට හඳුනා ගනිමින්, සමාජ පරිසරය, ආහාර සුරක්ෂිතතාව, මානව සම්පත් සංවර්ධනය, සැපයුම් ජාල සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය සහ රැකවරණය යන බහුවිධ සංවර්ධන ක්ෂේත්‍රවලට අදාළ බිම් මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති ඒවා වෙත යොමු කරනු ඇත.

05. ප්‍රජාශක්ති මෙහෙයුම් කමිටුව/ලේකම් කාර්යාලය - දිළිඳුබව තුරන් කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ප්‍රජාශක්ති ජාතික ප්‍රතිපත්ති සභාවට සහය වීම මෙයින් සිදු වේ.

06. ප්‍රජාශක්ති ජාතික ප්‍රතිපත්ති සභාව - ජනාධිපතිවරයා සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යවරයා ඇතුළත් ජාතික ප්‍රතිපත්ති සභාව, දිළිඳුකම තුරන් කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා විධාන නිකුත් කිරීමේ ඉහළම අධිකාරය වේ.

ශ්‍රී ලංකාවේ නිදහසින් පසු පාලනයන් තුළ බොහෝ කාලයක් ආහාර මුද්දර, ජනසවිය, සමෘද්ධිය, අස්වැසුම යන විවිධ නාමකරණයන් යටතේ දිළිඳු ජනතාව සඳහා වූ සහනාධාර වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වූ අතර, අවසන් නාමකරණය යටතේ තවමත් ක්‍රියාත්මක වෙමින් ඇත. මෙබඳු වැඩසටහන් ආරම්භයේදී ප්‍රකාශිත අරමුණු කෙසේ වෙතත්, දිළිඳු ජනතාව සහනාධාර දේශපාලනය තුළ බල අරමුණු වෙනුවෙන් කැටුව යාමේ වුවමනාව ප්‍රමුඛ විය.

ප්‍රජාශක්ති දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය ඇරඹී ඇත්තේ, එම අසාර්ථක ගමන තීරණාත්මක ලෙස වෙනස් කිරීමට ය; ජනතාව සැබෑ ලෙසම සවිබල ගන්වා ඔවුන් දිළිඳු බවේ හංවඩුවෙන් මුදා ගෙන ඔවුන් ගෞරවනීය පුරවැසියන් බවට පත් කිරීමට ය.

"වර්ෂ 2030 වන විට සෑම ආකාරයකම දරිද්‍රතාව අවසන් කළ යුතු ය" යන තේමාව එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කය **(Sustainable Development Goals - SDG)** වී තිබේ.

## සාහිත්‍යය සහ මිහයිල් ෂොලහොව් ....... 08 - පිටුවෙන්

ක්‍රියාකාරී වීම නොවැළැක්විය හැකි, අනිවාර්ය සාධකයක් නොවන්නේ ද? මනුෂ්‍යත්වය ස්වයං විනාශය කරා පිරිහෙළීම අරමුණු කරගත්තාවූ සතුරු බලවේගයනට එරෙහිව නැඟීසිටීමට අවංක ලේඛකයකු බැඳී නොසිටින්නේ ද?

එසේ නම් යුද්ධයේ උණුසුමින් බොහෝ දුරස්ව, මානව වර්ගයාගේ විඳවීම් පිළිබඳව උදාසීනත්වයෙන් යුතුව, දෙවියන් වහන්සේගේ ප්‍රතිරූපයක් මෙන් අබිසෙස් නොලබා, සැබෑ ජනතා පුත්‍රයකු ලෙස මානව වර්ගයාගෙන් එක් අංශුමාත්‍රයක් බවට පත්ව කලාකරුවා ඉටු කළ යුතු කාර්යභාරය කුමක් වන්නේ ද?

එය නම් අන් කිසිවක් නොව පාඨකයාහට සපුරා අවංක වීමයි; ජනතාවට සත්‍යවාදී වීමයි. විටෙක එය බෙහෙවින් අප්‍රසන්න දෙයක් වීමට පුළුවන. එහෙත්, ඔහු එය නිර්භයව ඉටු කළ යුතු ය. අනාගතය ගොඩනැඟීම උදෙසා වන ස්වශක්තිය පිළිබඳ විශ්වාසය, අනාගතය උදෙසා වන තිර විශ්වාසය මානවයාගේ හදවත්හි තිරසර ලෙස පිහිටුවාලිය යුතු ය. එසේම ලේඛකයා මුළු ලොව පුරාම සාමය උදෙසා සටන් වදිනා ජයග්‍රාහකයකු විය යුතු අතරම ඔහු සිය වදන් මඟින් එවන් වූ ජයග්‍රාහකයන්, විරුවන් තවත් බිහි කළ යුත්තේ ය. එසේම ප්‍රගතිය කරා වන මාවත කරා ජනතාව ඒකරාශී කළ යුත්තේ ය.

මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමේ සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේ ය. මා අවංකව අදහන පරිදි යමකුට තමා කලාකරුවෙකු ලෙසින් හඳුන්වා ගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු තම කෘතිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම උදෙසා යොදවන්නේ නම් හා ඔහු මනුෂ්‍ය වර්ගයා වෙත යහපත කැඳවන්නේ නම් පමණි.

සිය ඓතිහාසික ගමන් මඟේදී මගේ ජනතාව කිසි විටක හුදකලා මංමාවත්වලට යොමු වී නැත. සෑම විටම ඔවුන්ගේ මාවත වූයේ නව ජීවිතයක් උදෙසා සටන් වැදි පුරෝගාමීන්ගේ, ගවේෂකයන්ගේ මාවතයි. මෙතෙක් මා විසින් ලියන ලද මෙන්ම මතුවට ලියවෙනු ඇත්තාවූ සෑම දෙයක දීම මගේ සැලැකිල්ල යොමු වූයේ සහ යොමුවනු ඇත්තේ ලේඛකයකු වශයෙන් මගේ කාර්යභාරය යනු අන් කිසිවක් නොව, මෙතුවක් කල් කිසිවකුට ප්‍රහාර එල්ල නොකළාවූ ද, එසේම තමන් විසින් නිර්මාණය කරන ලද්දා වූ ලෝකය, එහි නිදහස හා ගරුත්වය ආරක්ෂා කරන්නේ කෙසේදැයි දන්නා වූ එසේම එහි මනාපය පරිදි අනාගතය ගොඩනැඟීම උදෙසා වන හිමිකම ඇත්තා වූත් මෙම වීරෝදාර ජාතියට, ගොඩනඟන්නන්ගේ ජාතියට, කම්කරු ජනතාවට මගේ උපරිම ප්‍රණාමය දැක්වීම ය යන්න කෙරෙහි ය.

මගේ කෘති මානව වර්ගයාගේ සිත් සතන් වඩ වඩා නිර්මල කිරීමට, වඩ වඩා යහපත් වීම සඳහා මිනිසාට මඟපෙන්වීමට ඉවහල් වන්නේ නම්, මම ඒ පිළිබඳව උදක්ම සතුටු වෙමි.

එසේම මගේ කෘති මඟින් තම සගයන් වෙත ආදරය දැක්වීමට මානව වර්ගයාගේ අභිවෘද්ධිය, පරමාදර්ශ උදෙසා සටන් වැදීමට මිනිසා පොළඹවනු ලබන්නේ නම් මම ඒ පිළිබඳව ද අවංකවම සතුටු වෙමි.

අවසන් වශයෙන් මෙම රාත්‍රියෙහි මෙහි රැස්ව සිටිනා ඔබට හා නොබෙල් ත්‍යාගය ලැබීම සම්බන්ධයෙන් මට සුබ පැතුම් එවූ සියලු දෙනාටම ස්තුති කරනු කැමැත්තෙමි.

# සාහිත්‍යය සහ මිහයිල් ෂොලහොව්

**1965 වසරේදී සාහිත්‍යය සඳහා වන නොබෙල් ත්‍යාගය පිළිගනිමින් සෝවියට් ලේඛක මිහයිල් ෂොලොහොව් විසින් නොබෙල් කමිටුව ඉදිරියේ පවත්වන ලද දේශනය.**

මෙම සදානුස්මරණීය අවස්ථාවේදී සාහිත්‍යය පිළිබඳ නොබෙල් ත්‍යාගය මා හට පිරිනැමූ ස්වීඩන් රාජ්‍ය ඇකඩමියට නැවත වතාවක් මගේ හෘදයාංගම ස්තුතිය පුද කර සිටීම මා'විසින් ඉටු කළ යුතුව ඇත්තා වූ ප්‍රියජනක යුතුකමක් සේ මම හඟිමි.

ම'විසින් දැනටමත් ප්‍රකාශ කෙරී ඇති පරිදි මෙම ත්‍යාගය පිරිනමනු ලැබීම මඟින් මා තුළ උපද්දන ලද්දාවූ තෘප්තිය පිළිබඳ හැඟීම හුදෙක් මගේ වෘත්තීයමය කුසලතා හා ලේඛකයකු වශයෙන් මගේ පෞද්ගලික චරිත ස්වභාවයන් හට ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලැබීමෙන් හට ගත්තක් නොවන්නේය. එහෙත්, මෙම ත්‍යාගය රුසියානුවකුට, සෝවියට් ලේඛකයකුට පිරිනැමීම පිළිබඳව මම සපුරා සතුටට පත් වෙමි. මම මෙහිදී මගේ දේශයෙහි වාසය කරන විශාල සංඛ්‍යාවක්වන ලේඛකයන් සියලුම දෙනා නියෝජනය කරමි.

සාහිත්‍ය ප්‍රභේදයක් වශයෙන් නවකතාව කෙරේ දක්වන ලද වක්‍ර පිළිගැනීමක් මෙම ත්‍යාගය මඟින් පිළිබිඹු වන හෙයින්, ඒ පිළිබඳව මගේ කෘතවේදීත්වය මම මීට පෙර වතාවකදී ප්‍රකාශ කර සිටියෙමි. නවකතාව, තත්කාලීන අවශ්‍යතා නිරූපණයෙහිලා බෙහෙවින් අසමත්, යල්පිනූ ආකෘතියක්ය යනුවෙන් කෙරෙනා බොහෝ ප්‍රකාශයන්ට මම නොයෙක් විට සවන් දී ඇත්තෙමි; කියවා ඇත්තෙමි. එවන් දෑ ඇසීමෙන්, කියැවීමෙන් මා විමතියට පත් බව අවංකවම ප්‍රකාශ කළ යුතුය. එහෙත්, යථාර්ථවාදී ලෝකය පිළිබඳ වඩා පූර්ණ අවබෝධයක් ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්නේත්, මෙම විශ්වය හා එහි දැවෙන ප්‍රශ්න විෂයයෙහි යමකුගේ ආකල්ප ප්‍රක්ෂේපණයෙහිලා මං පාදන්නේත් නවකතාව නම් වූ ප්‍රභේදයමය.

විශ්වයේ මාධ්‍ය ලක්ෂ්‍යය ලෙස යමකුගේ ක්ෂුද්‍ර ආත්මය පෙරටුව ගැනීම වෙනුවට අප වටා පවතින විස්තෘත ලෝකය අවලෝකනය කිරීම හා නිරූපණය කිරීමට වඩා ප්‍රබල නැඹුරුවක් ඇත්තේ නවකතාව නම් වූ ප්‍රභේදය යැයි යමකුට පැවසිය හැකිය. ස්වභාවයෙන්ම මෙම නවකතාව නම් ප්‍රභේදය යථාර්ථවාදී කලාකරුවා හට අතිශය පුළුල් අවකාශයක් විවර කර දෙයි.

කලාවේ නියුතු බොහෝ වත්මන් වගාඩම්බරකාරයෝ යථාර්ථවාදය ස්වකීය යුගය අවසාන කර ඇතැයි පවසමින් එය සපුරා ප්‍රතික්ෂේප කරති. එහෙත් යල්පිනූ මතවාද දරන්නකු යැයි අපවාදයට ලක්වීම පිළිබඳව බියකින්, චකිතයකින් තොරව මම, මෙහිදී මා වනාහි ඊට මුළුමනින්ම ප්‍රතිපක්ෂ මතයක් දරන්නෙකැයිද, එසේම, යථාර්ථවාදී කලාවේ ශක්‍යතා අවබෝධ කරගත්, ඊට කොන්දේසි විරහිත පක්ෂපාතීත්වය දක්වන්නෙකැයිද ප්‍රකාශ කර සිටිමි.

වර්තමානයේදී බොහෝ කොට නූතනවාදී අත්හදාබැලීම්වලට අදාළව, විශේෂයෙන්ම ආකෘතිය සම්බන්ධයෙන් වන්නාවූ අත්හදාබැලීම් පිළිබඳව කෙරෙනා සාහිත්‍යමය නවරැල්ලක් පිළිබඳව බොහෝ කතාබහ ඇතිව තිබේ. එහෙත්, සිය කෘතීන් මඟින් අප යුගයේ ජීවිතයෙහි අනාවරණය කිරීමෙහිලා කලාකරුවෝ සැබෑ පුරෝගාමීහු වන්නෝය යන්න මගේ මතයයි.



**"මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමේ සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකව අදහන පරිදි යමකුට තමා කලාකරුවකු ලෙසින් හඳුන්වා ගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු තම කෘතිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම උදෙසා යොදවන්නේ නම් හා ඔහු මනුෂ්‍ය වර්ගයා වෙත යහපත කැඳවන්නේ නම් පමණි."**

සමස්තයක් වශයෙන් ගත් කල යථාර්ථවාදය හා යථාර්ථවාදී නවකතාව යන මේ ද්විත්වයම අතීතයේ විසූ ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවන් විසින් ඉදිරිපත් කරන ලද්දා වූ කලාත්මක අත්දැකීම් මත පදනම්ව ඇත්තේය. කෙසේ වෙතත්, එහි සංවර්ධනයේදී නූතන වන්නාවූ බොහෝ වැදගත් අංගෝපාංගයන් ඊට එකතු වී තිබේ.

ජීවිතය ප්‍රතිනිර්මාණය කිරීම, මානව වර්ගයාගේ යහපත උදෙසා එය යළි හැඩගැන්වීම යන්න ස්වකීය සංකල්පය තුළ ගැබ්ව ඇත්තා වූ යථාර්ථවාදයක් පිළිබඳව මෙහිදී මම කතා කරමි. සැබැවින්ම මා මෙහිදී අදහස් කරනුයේ, සමාජවාදී යථාර්ථවාදය යනුවෙන් අප විසින් විස්තර කරනු ලබන්නාවූ යථාර්ථවාදය පිළිබඳවය. එහි ගැබ්ව ඇති සුවිශේෂී ගුණය වන්නේ, එමඟින් ලොව ප්‍රතික්ෂේප කිරීම හෝ යථාර්ථයෙන් පලා යාම භාර ගන්නාවූ දර්ශනයක් නොව මිනිසාගේ අරගලයේ මාවත ආලෝකවත් කරන දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ අරගලයේ මාවත ආලෝකවත් කරන දශ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ හදවත් ආලෝලනය කරන්නා වූ අරමුණු ප්‍රකාශ වීමට මඟපාදන්නා වූ දර්ශනයක් පළ වීමය.

මනුෂ්‍ය වර්ගයා යනු පොළොවේ ගුරුත්වාකර්ෂණයෙන් මිදීගත් අජටාකාශගාමීන් මෙන් රික්තයක් තුළ ඔබ මොබ යන්නා වූ, එකිනෙකාගෙන් වෙන් වූ, හුදකලා වූ පිරිසක් නොවේ. මේ මහපොළොව මත ජීවත් වන අපි එහි නියමයන්ට යටත් වෙන්නා සේම, ශුභාරංචියෙහි පැවසෙන්නාක් පරිදි එම නියාමයන් තුළ අයහපත, ප්‍රශ්න හා පරීක්ෂාවන් මෙන්ම වඩා හොඳ අනාගතයක් උදෙසා වන අපේක්ෂාවන්ද ගැබ් වී ඇත්තේය. ලොව ජනගහනයෙන් අතිවිශාල පිරිසක් එකබඳුම අපේක්ෂාවන්ගෙන් පොළඹවනු ලබන අතරම එකිනෙකා වෙන් කිරීම වෙනුවට ඔවුහු මෙම අපේක්ෂාවන්ගෙන් එකට බැඳී සිටින්නෝය.

ස්වකීය දෑතින් හා ප්‍රඥා මහිමයෙන් සෑම සියලු දෙයම නිර්මාණය කරන්නෝ වැඩ කරන ජනතාවය. මෙම වැඩ කරන ජනතාව වෙනුවෙන් ස්වකීය පන්හිඳ කිසිදු ආකාරයක අවහිරයකින්, බාධාවකින් තොරව මෙහෙයැවීමට ලැබීම තමන් ලබනා ඉහළම ගෞරවය යැයිද, තමන්ට ඒ සඳහා උපරිම නිදහස තිබිය යුතු යැයිද යන්න අදහන ලේඛකයන්ගෙන් මමද අයෙක්මි. මූලිකම පදනම වන්නේ එයයි. වත්මන් ලෝකය තුළ කලාකරුවකු හට හිමි ස්ථානය සෝවියට් ලේඛකයකු වශයෙන් මා දකින්නේ කෙසේද යන්න නිගමනය වන්නේ එමඟිනි.

අප වෙසෙනා මෙම ලෝකය පිරී පවතිනුයේ අවිනිශ්චිතතාවෙනි. මුළු හදින්ම යුද්ධය ප්‍රාර්ථනා කරන එකම ජාතියක්වත් මේ මිහිපිට නැත්තේය. නමුදු, යුද්ධයේ ගිනි උදුන වෙත සමස්ත ජනතාවම දක්කන්නට වලිකන අධම බලවේගයක් ඇත්තේය. දෙවන ලෝක සංග්‍රාමය නම්වූ විස්තර කළ නොහැකි තරම් දරුණු ලැව්ගින්නෙන් මතුවූ අළු හමුවේ ලේඛකයාගේ හදවත

07 කලාපය